රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ**

**නිෂ්පාදක (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නිෂ්පාදක (දෙපාර්තමේන්තුගත) තනතුරෙහි පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් රාජ්‍ය සේවයේ නිරතව සිටින නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් දිනට හෝ ඊට පෙර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, නො.163, කිරුළපන මාවත, කොළඹ 05 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නිෂ්පාදක (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ). අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනය 2025.05.30 දින වේ.

සටහන : අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

**1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා උක්ත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

**2. අවශ්‍ය සුදුසුකම් :**

I. වෘත්තීය සුදුසුකම් :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරී - I වන ශ්‍රේණියේ තනතුරක සේවයේ නිරත වීම

II. පළපුරුද්ද :

රජයේ චිත්‍රපට අංශයේ වීඩියෝ කැමරාකරණය, සංස්කරණය, රසායනාගාර කටයුතු හා ශබ්ද කාර්මික තාක්ෂණය යන ක්ෂේත්‍රයන්ගෙන් එකක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් තිබිය යුතුය

III. කායික සුදුසුකම් :

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මනා කායික හා මානසික ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය

IV. වෙනත් සුදුසුකම් :

(අ). ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය

(ආ). විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය

(ඇ). නියමිත දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඇ). රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(ඉ). අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට එනම්, 2025.05.30 දිනට මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

iii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීනතාව ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

**4. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

**සටහන**

I. ඉහත 04 ඡේදයේ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවෙකු යනු (ආයතන සංග්‍රහයේ I වන පරිච්ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි) අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට සේවයේ ස්ථිර කරන ලද රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු වේ

II. අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු කාලය තුළදී හෝ සේවයේ යෙදී සිටි කාල සීමාව ඊට අඩු නම් එම මුළු කාල සීමාවේදී හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබා තිබුණි නම් මිස නැත්නම් දැනට රාජ්‍ය සේවයේ නියුතු කිසිදු නිලධාරියෙකු මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා යෝග්‍ය නොවනු ඇත

III. රාජ්‍ය සේවයේ නිලධාරියෙකු සතුටුදායක සේවා වාර්තා ලබා ඇති සේ සලකනු ලබන්නේ ඔහු / ඇය අයදුම්පත් භාර ගැනීම අවසාන කරන දිනට පෙරාතුව පස් අවුරුදු කාල සීමාව තුළ හෝ තත් ආයතනයේ මුළු සේවා කාලය ඊට අඩු නම් එම මුළු සේවා කාලය තුළ හෝ යෙදුණු සියලු වැටුප් වර්ධක ද උපයාගෙන, එකී කාල සීමාව තුල කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීමක් හැර) කිසිදු අන්දමක දඩුවමක් නොලැබ සිටියේ නම් පමණකි.

IV. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත් එවිය යුත්තේ තම තමන්ගේ අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මගිනි

**5. වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL 1 – 2025, රු.82,150-10x2,400-8x2,940-17x3,900-195,970/=ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

6. **සම්මුඛ පරීක්ෂණය** :

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂණය පවත්වනු ලැබේ

II. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ආකාරය පහත පරිදි වේ

| | පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උප ශීර්ෂය යටතේ උපරිම ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 1. | අතිරේක පළපුරුද්ද<br>ඉහත 2 ii හි පළපුරුද්ද යටතේ සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය දක්වා වන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 01/2019 (1) අනුව ලකුණු ලබා දෙනු ඇත | 30 | 30 |
| 2. | අතිරේක වෘත්තීය සුදුසුකම්<br>චිත්‍රපට අංශයේ වීඩියෝ කැමරාකරණය, සංස්කරණය, රසායනාගාර කටයුතු හා ශබ්ද කාර්මික තාක්ෂණය යන ක්ෂේත්‍රයන් පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් / පුහුණු ආයතනයකින් ලබා ගත්,<br>• මාස 09කට නොඅඩු ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක්<br>• මාස 06කට නොඅඩු ඩිප්ලෝමාවක්<br>• සහතිකපත්‍ර<br>සටහන - උපරිම සුදුසුකම් දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ | <br><br>15<br>10<br>06 | 30 |
| 3. | විශේෂ කුසලතා සඳහා<br>i. දේශීය සම්මාන / ඇගයීම් - එකකට ලකුණු 03 බැගින්<br>ii. විදේශීය සම්මාන / ඇගයීම් - එකකට ලකුණු 05 බැගින් | 15 | 35 |
| | iii. විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් - (රාජකාරියට පරිබාහිර විය යුතුයි) එකකට ලකුණු 02 බැගින් (ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි) | 10 | |
| | iv. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් පිරිනමනු ලබන ප්‍රශංසා සඳහා | 10 | |

| | | | |
|---|---|---|---|
| | සටහන : පොදු 230 b ආකෘතිය මඟින් පිරිනමන ලද ප්‍රශංසා සහතික සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. ප්‍රශංසා සහතිකයක් සඳහා ලකුණු 02 බැගින් | | |
| 4. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | - | 05 |
| 5. | **එකතුව** | | **100** |

**7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :**

වව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

iii. වලංගු රියදුරු බලපත්‍රය

**8. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

.................................

ලේකම්,

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025/05 මස 19 දින

කේ. එම්. වත්සලා ප්‍රියදර්ශණි
ලේකම් (වැ.බ.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නිෂ්පාදක (දෙපාර්තමේන්තුගත)**

**තනතුර සඳහා බඳවා ගැනීම**

1.0 මාධ්‍යය :

සිංහල - 1

දෙමළ - 2

ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුල'කුරු අගට යොදා මුලකුරු සමඟ නම : ..........................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : SILVA, A.B.

2.2 සම්පූර්ණ නම : ..........................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 සම්පූර්ණ නම : ..........................................................

(සිංහලෙන් / දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය : ..........................................................

(සිංහලෙන් / දෙමළෙන්)

2.5 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0

ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.6 විවාහක / අවිවාහක බව : අවිවාහක - 1

විවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉ.දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.8 ජාතික හැඳුනුම්පත් අංකය :

2.9 උපන් දිනය : වර්ෂය මාසය : දිනය :

2.10 දුරකථන අංකය (තිබේ නම්) : | | | | | | | | | | |

3.0 පළපුරුද්ද :

3.1 තනතුරට පත් වූ දිනය : ..................................................................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට මුළු සේවා කාලය : ............................................

4.0 වෘත්තීය සුදුසුකම් :

4.1 I වන ශ්‍රේණියට උසස් වූ දිනය : ..........................................................

4.2 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට I වන ශ්‍රේණියේ මුළු සේවා කාලය : ...................

4.3 විශේෂ ශ්‍රේණියට උසස් වූ දිනය : ..........................................................

4.4 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට විශේෂ ශ්‍රේණියේ මුළු සේවා කාලය : .................

5.0 අතිරේක වෘත්තීය සුදුසුකම් : ..................................................................................

(රජයේ චිත්‍රපට අංශයේ වීඩියෝ කැමරාකරණය/ සංස්කරණය/ රසායනාගාර කටයුතු හා ශබ්ද කාර්මික තාක්ෂණය යන ක්ෂේත්‍රයන්ගෙන් අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයට ලබා ඇති සුදුසුකම් සඳහන් කරන්න)

6.0 විශේෂ කුසලතා : ..................................................................................................

(ලබා ඇති විශේෂ කුසලතා පිළිබඳ සඳහන් කරන්න)

7.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහතික කරමි.

.................................... ......................................

දිනය අයදුම්කරුගේ අත්සන

8.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිෂ්පාදක තනතුර සඳහා ඉල්ලුම් කර සිටින ................... ............................................ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවය කරන ඉහත අත්සන් තබා ඇති ........................................................................................ මයා / මිය /මෙනවිය දැනට ............................................................................................ තනතුරේ සේවය කරන බව ද, ඔහුගේ / ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද සහතික කරන අතර ඔහු /ඇය විසින් ඉදිරිපත් කරන මෙම ඉල්ලුම්පත නිර්දේශ කරමි.

.....................................................................

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .........................................

නිල මුද්‍රාව : .........................................